# පාණිනී ප්‍රණීත දුඃස්පෘෂ්ටාක්ෂරය

පනාවල ධම්මධජ හිමි[1]

පාණිනාචාර්යයින් දක්වන ලද දුඃස්පෘෂ්ටාක්ෂරය කුමක් ද යි තහවුරු කිරීම මේ පර්යේෂණයෙහි අරමුණ යි. වෛදික සංස්කෘතය ලෞකික සංස්කෘතය බවට පරිණාමය වීම තහවුරු වන්නේ පාණිනී ආචාර්යවරයා ස්වකීය ව්‍යාකරණ නිර්මාණය වූ අෂ්ටාධ්‍යායී හරහා වෛදිකයෙහි භාවිතය සීමා සහිත කිරීමත් සමඟින් ය යනු උගතුන්ගේ පිළිගැනීම යි. අෂ්ටාධ්‍යායී යනු පාණිනී මතය සංග්‍රහ කිරීමක් ම නො වේ. පෙර සිටි ආචාර්යවරුන් පිළිගත් ව්‍යාකරණ මතවාද ක්‍රමවත් ව සංග්‍රහ කිරීමකි. එහි දී ඔහු සංස්කෘත භාෂාව සඳහා අක්ෂරමාලාවක් ද හඳුන්වා දිනි. ඒ අක්ෂරමාලාව අක්ෂර හැට හතරකින් (64) සමන්විත වූයේ දීර්ඝ ඏ'කාරය ද සහිත ව ය. එය රහිත ව අක්ෂර හැට තුනක් (63) විය. ඒ අක්ෂරමාලාව පහත පරිදි වර්ගීකරණය කොට ඇත. මේ අනුව ස්වර 21ක්, ස්පර්ශ 25ක්, යාදී 08ක්, යම 04ක්, අනුස්වාරය, විසර්ගය, ජිහ්වාමූලීය, උපධ්මානීය සහ දුඃස්පෘෂ්ටය එක් වී සකලාක්ෂර 63ක් සෑදී ඇත. පාණිනී දුඃස්පෘෂ්ටාක්ෂරය යනු කුමක් ද යි නම් කොට නැත. එහෙත් තද්වචනාර්ථය අනුව උච්චාරණයට අපහසු අක්ෂරයක් ගැන පවසන බව වැටහෙයි. "හවාල්ලිඛති" යන තැන්හි එන චන්‍ද්‍රබින්දුව උච්චාරණයට අපහසු බැවින් දුඃස්පෘෂ්ටාක්ෂරය ලෙස ගැනීම වරදක් නො වේ. එහෙත් එය ස්ථිර වශයෙන් සඳහන් කළ තැනක් හමු නො වේ. "ශබ්දකෞස්තුභ" නම් ග්‍රන්ථයෙහි දක්වෙන පරිදි මූර්ධන්‍ය ළ'කාරය දුඃස්පෘෂ්ටාක්ෂරය ලෙස සලකා ඇත. වෛදිකයෙහි "අග්නිමීළෙ" වැනි තැන්වල යෙදෙන ළ'කාරය මෙයින් අදහස් වේ. පාලියෙහි මෙය ප්‍රකට වූවකි. මූර්ධන්‍යාක්ෂරයන්ට කරණය වන්නේ දිව අග සමීපයේ ය. එහෙත් මූර්ධන්‍ය ළ'කාරය හකාරය සමඟ සංයුක්ත වූ විට පමණක් දිව අග ළඟ කරණය වී පැහැදිලි ව උච්චාරණය වන අතර සෙසු අවස්ථාවල මූර්ධන්‍ය ළ'කාරය දිව අග ළඟ කරණය වෙමින් උච්චාරණය වන්නේ අල්ප වශයෙනි. ඒ නිසා මේ මූර්ධන්‍ය ළ'කාරයෙහි දුඃස්පෘෂ්ට ලක්ෂණ ඇති හෙයින් ඒ අක්ෂරය දුඃස්පෘෂ්ටාක්ෂරය උපකල්පනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** පාණිනී, වර්ණමාලාව, වර්ණභේද, දුඃස්පෘෂ්ටාක්ෂර, සංස්කෘත ව්‍යාකරණය

[1] සංස්කෘත අධ්‍යයනාංශය